# දේශප්‍රේමීන් පෝරකයට?



පසුගිය ජනාධිපතිවරණය අවසානයත් සමග වෙනදා මෙන් විරුද්ධවාදීන්ගෙන් පලිගැනීම ආරම්භ විය. එය වැඩපළ කාර්යාලය පොලිසිය පමණක් නොව ආරක්ෂක අංශ දක්වාද වර්ධනය වී ඇත . ශ්‍රී ලංකාව ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයක් ලෙස හඳුන්වනු ලැබුවද අද වන විට විරුද්ධ දේශපාලන මත දැරීම දඬුකඳේ ගසන වරදක් බවට පත් වී ඇත. එසේ නොමැති නම් ඔවුන්ගේ තත්වය තරාතිරම අනුව රාජ්‍ය මාධ්‍ය මාෆියාවට හසු කර ඔවුන්ගේ ආත්මය විනාශ කර දැමීමද සිදුවන්නේ මෙම ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළමය. තවද මෙවැනි දේ විවේචනය හෝ සත්‍ය තතු ජනතාවට කියාපෑමට උත්සාහ කරන මාද්‍යවේදියකු හෝ වෙනත් චරිතයක් ඇත්නම් සදා නිහඬ කරවන අපරාධ සිදුවන්නේද මේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළමය.

ජනාධිපතිවරණය අවසානයත් සමග ආරක්ෂක අංශ වල විශ්‍රාම ගිය හා සේවයේ නියුතු බොහෝ දෙනෙක් අත්අඩංගුවට පත්විය. ඒ රජය පෙරළීමට කුමන්ත්‍රණය කිරීමේ චෝදනාව මත ය. ඒ සමගම ප්‍රධාන ජනාධිපතිවරණ විරුද්ධ පක්ෂ අපේක්ෂක විශ්‍රාමලත් ජෙනරල් සරත් ෆොන්සේකා මහතා ද අත් අඩංගුවට ගන්නා ලදී. ඔහු යුද අධිකරණයකට ගෙන යන බව බලවත්තු ප්‍රකාශ කරති. මෙසේ අත්අඩංගුවට පත් වූයේ අවුරුදු 30 ක කුරිරු ත්‍රස්තවාදයෙන් අපේ මව්බිම වැනසූ එල්ටීටීඊ ය පරාජය කර මව්බිම බේරාගැනීමට නායකත්වය දුන් හිටපු හමුදාපති හා එම කාර්යය සඳහා ඔහුට නොමඳ සහයක් ලබා දුන් හමුදාවේ උසස් නිලධරයන් ය. ඔවුහු අප මව්බිම ත්‍රස්තවාදයෙන් මුදවා ගත් යුද වීරයෝ ය. එසේත් නැති නම් ඔවුහු අප රටේ දේශප්‍රේමී නායකයෝ ය.

අද ඔවුන් යුද කඳවුරු තුළ සිර කුටි වල ය. නැතිනම් ඔවුන් දේශද්‍රෝහීන් ය. ඊට හේතුව කුමක් ද? ඔවුන් පාලක පක්ෂයට විරුද්ධ දේශපාලන මත දැරීම ය. නමුත් සේවයෙන් විශ්‍රාම ගිය පසු රජය විවේචනය කිරීමට හෝ විරුද්ධ දේශපාලන අදහස් දැරීමට ප්‍රජාතාන්ත්‍රික අයිතියක් ඇති බව අප පිළිගත යුතුය.

"රජය පවසන හා රාජ්‍ය මාධ්‍ය මාෆියාව මගින් ජනතාව මුලා කිරීමට උත්සාහ කරන ආකාරයේ රාජ්‍ය බලය ලබා ගැනීමේ කුමන්ත්‍රණයක් ඔවුන් කර ඇතැයි සිතිය නොහැකිය. ඊට හේතුව වන්නේ මීට මාස ගණනාවකට පෙර සියලුම රාජ්‍ය හමුදා බලය අතැතිව සිටි ඔවුන්ට අවශ්‍ය නම් නිමේශයකින් ඒ කටයුත්ත කළ හැකිව තිබීමයි. ඒ සඳහා පරාජිත දේශපාලන පක්ෂ සමග කඳවුරු බැඳගෙන විරුද්ධපාක්ෂික අපහාස - චරිත ඝාතන හා නින්දා වලට ලක්වෙමින් රට වටා යා යුතු නැත . එසේ නම් ඔවුන් බලය ලබා ගැනීමට උත්සාහ කර ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ය. තවද එම ප්‍රජාතාන්ත්‍රික පිළිවෙතට අනුව මැතිවරණ කොමසාරිස් තුමා දෙවන වර ප්‍රකාශ කළ පරිදි පැවැත්වූයේ සාධාරණ මැතිවරණයක් නම් එම ප්‍රතිඵලයට අනුව වුව ද ශ්‍රී ලාංකිකයන් ලක්ෂ 40 ක් ඔහුට කැමැත්ත ප්‍රකාශ කර ඇත.

මොන දේ වුව ද මෙම රාජ්‍ය ත්‍රස්තවාදය හමුවේ සිත්තැවුලට පත් හමුදා නිලධරයන්ගේ ශෝචණීය පුවත් දිනෙන් දින අසන්නට ලැබෙයි. එක් හමුදා නිලධරයකු උසාවියේ දී විනිසුරු අමතා පැවසුවේ රට වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ තමන්ට අද සිදුවී ඇති දේ ගැන සිතන විට තමාට ගෙල වැල දාගෙන මිය යන්නට සිතෙන බවත් එහෙත් දරුවන් හා බිරිඳ ගැන සිතා ඉවසා සිටින බවත් ය. තවත් ආබාධිත සොල්දාදුවකු අත්අඩංගුවට ගෙන ඇස් බැම් හා ඇස් පිහාටු පවා ගලවා ජෙනරාල් සරත් ෆොන්සේකා ජනප්‍රිය ටෙලි නාට්‍ය නිළියක් සමග සම්බන්ධකම් පවත්වනු දුටු බවට ලිපියක් අත්සන් කරවා ගැනීමට උත්සාහ කරඇත.

වරෙක දූෂණයෙන් පිරුණ සංස්ථාවක බලවතෙකු ඉවත් කර ඒ සඳහා හමුදාවේ සේවය කළ තවත් උසස් නිලධරයකුට එම සංස්ථාව භාර කරන ලදී. ඔහු එය ඉතා ඉක්මණින් විනයගරුක ආයතනයක් ලෙස දියුණු කළේ ය. එහි සම්පත් පසුව ජනාධිපතිවරණයේදී නීති විරෝධී ලෙස රාජ්‍යපාක්ෂික දේශපාලනයට යොදා ගැනීමට නොදීමේ හේතුව නිසා අද ඔහු අත්අඩංගුවට ගෙන රහස් පොලීසිය මගින් ප්‍රශ්න කරනු ලබයි. මෙසේ මොනම අයුරකින්වත් කොටු කර ගැනීමට අපොහොසත් වූ තවත් පිරිසක් උසාවියේ නියෝග මත නිදහස් කරන ලදී. මේ සිදුවන්නේ කුමක් ද?

ජෙනරාල් අත් අඩංගුවට ගත් පසුව රට පුරා හා ලෝකයේ ප්‍රධාන නගර වලත් විරෝධතා ව්‍යාපාර ඇති විය. දැන් මෙම විරෝධතා සෙමින් නිවී යමින් පවතියි. යුද්ධයේ ජයග්‍රහණයෙන් පසු ජාතික වීරවරයකු කළ ඔහු මාස කීපයකට පසු ආරක්ෂක අංශයේම පුංචි සිරකුටියක සිර කර ඇත . මෙයත් ජයත්‍යන්තර කුමන්ත්‍රණයක් ද? එසේත් නැතිනම් එල්ටීටීඊ සංවිධානයේ ක්‍රියාවක් ද? කෙසේ නමුත් එල්ටීටීඊ නායකයන් පරලොව සිට සැබෑ සිංහලයන්ගේ ගති පැවතුම් ගැන මුවින් පමණක් නොව අධෝමුඛයෙනුත් සිනාසෙනවා නොඅනුමානය. එල්ටීටීඊ යට කරගැනීමට නොහැකි වූ දෙය ඔවුන්ගේ නායකයන් මිය යාමෙන් පසුව වුව ද රජපක්ෂ ආණ්ඩුව ලවා කරවා ගැනීමට සමත්වීම සිංහල ජාතිය ලැබූ දෛවයේ සරදමක් ද? එය වඩාත් තිව්‍ර කරමින් අද ජීවත් වන එල්ටීටීඊ ප්‍රබලම නායකයා ලොව ඉහළම සූපවේදීන්ගේ දෑතින් නිම වූ රස බොජුන් වල පහස ලබමින් සුවිසල් මැදුරක කල් ගෙවන්නේ ය. රුදුරු ත්‍රස්තවාදීන්ගෙන් මාතෘභූමිය බේරාගත් රණ විරුවෝ අඳුරු සිරකුටි වල වද විඳිති. මෙය ප්‍රෞඪ සිංහල ජාතියේ ජන්ම ගතිය ලොවට විදහා පෙන්වන ප්‍රබල කැඩපතක් බඳු ය. රජයේ මෙම ක්‍රියා පිළිවෙතට විරෝධය පෑමට ත්‍රෛයිනිකායික මහනා හිමිවරුන් සංඝ සම්මේලනයක් කැඳවීමට උත්සාහ කළ ද දේශප්‍රේමීන් යයි කියා ගන්නා දේශද්‍රෝහීන් රාජ්‍ය මාධ්‍ය මාෆියාවේ සහයද ඇතිව කරන ලද බිය වැද්දීම් හා තර්ජන හමුවේ ශාසනයේ උන්නතිය උදෙසා එම විරෝධතාව එතුමෝ අතහැර දැමූ හ.

මෙසේ රණවිරුවන් සිරකොට ත්‍රස්තවාදීන්ට රජ සැප දෙන විට අප රටේ දේශප්‍රේමී නායකයන් මුණිවත රැකීමෙන් පිලිබිඹු වන්නේ කුමක් ද? පසුගිය සංග්‍රාම සමය පුරා රට ජාතිය බේරා ගැවනීමට හමුදාවට සහය ලබා දෙන මෙන් හඬ නැගූ මෙල්බර්න් දේශප්‍රේමී සංවිධාන අද මුණිවත රකින්නේ ඇයි. මෙය පසුගිය දශක කීපය තුළ යුද්ධයට මුවා වී සිටි සැබෑ දේශප්‍රේමීන් කව්දැයි හඳුනා ගැනීමට ජනතාවට ලැබුණ කදිම අවස්ථාවකි. ලොව පුරා ගිය විරෝධතා රැල්ලට විරුද්ධව රාජපාක්ෂික මෙල්බර්න් තරුණ මාධ්‍යකරුවකු ප්‍රකාශ කළේ විරෝධතා පෑමට පෙර පළමුව අදිකරණයට යා යුතුව තිබුණ බවයි. ශ්‍රී ලංකා රාජ්‍ය ජනාධිපති ක්‍රමය තුළ අධිකරණ නියෝග වලංගු නැති බව තේරුම් ගැනීමට එම තරුණ මාධ්‍යවේදියා පරිනත නොවීම කණගාටුවට කරුණකි.

එදා දශක තුනක කාලයක් ශ්‍රී ලංකාව ගොදුරු කර ගත් කුරිරු ත්‍රස්තවාදය විනාශ කර රට බේරාගත් ආරක්ෂක හමුදා වල අහස උසට නැග තිබූ චිත්ත ධෛර්යය අද බින්දුවටම බැස ඇත .

ඒ වෙනුවට අද ඉතිරිව ඇති භේද බින්න කරන ලද රටේ ආරක්ෂක හමුදාව තවත් එවැනිම ප්‍රශ්නයකට අද මුහුණ දීමට සිදුවුව හොත් සිදුවන දේ ගැන ඔබට සිතාගත නොහැකි ද? යමෙක් වරදක් කර ඇත්නම් අත්අඩංගුවට ගෙන චෝදනා ඉදිරිපත් කර දඬුවම් දීම වරදක් නොවේ. එය අනිවාර්යයෙන්ම රටේ නීතිය විය යුතු ය. නමුත් මෙම අත්අඩංගුවට ගත් කිසිවකුටත් අද වන තුරු චෝදනා පත්‍රයක් ඉදිරිපත් කිරීමට රජය අපොහොසත් වී ඇත . මෙයින් හැඟි යන්නේ ඔවුන් අත්අඩංගුවට ගෙන ඇත්තේ විරුද්ධ දේශපාලන මත දැරීම හා ඔවුන් රාජ්‍ය ගැත්තන් නොවීම නිසා ය. කල් ගත වී හෝ මොනයම් අයුරකින් චෝදනා ඉදිරිපත් කර ඔවුන්ගේ ආත්මය විනාශ කිරීමට රජය නොපසුබට වන බවත් කිව යුතු ය.

කෙසේ වුවද ජනරාල් සරත් ෆොන්සේකා මහතාට එල්ටීටීඊ ජීවමාන නායක කේ පී ට තරම් වත් සාධාරණයක් ඉටු නොවන බව නම් පැහැදිළි ය. අත් අඩංගුවට ගෙන මාසයකටත් වැඩි කාලයක් වුව ද දැනට ජනතාවට ප්‍රසිද්ධ කර ඇති චෝදනාව වන්නේ ඔහුගේ ඥාතියෙකුගේ සේප්පුවක තිබූ කෝටි 7 ක් වටිනා විදේශ මුදල් ප්‍රමාණයක් ගැන ය. එහිදී සළකා බැලිය යුත්තේ එතරම් වත් සොච්චමක් නොමැතිව ශ්‍රී ලංකාව වැනි රටක ජනාධිපතිවරණ අපේක්ෂකයකු ලෙස කළ හැක්කේ කුමක්ද යන්නයි. පියාගේ ජනාධිපතිවරණය වෙනුවෙන් පුත් නාමල් තාරුණ්‍යයට හෙටක් මත නැගී වියදම් කළ මුදල කෝටි 200 කි. මෙම මුදල් කොහෙන් කාගෙන් ලැබුණාදැයි සෙවීමට කිසිවකුත් නැත . රාජ්‍යපාක්ෂිකයන්ගේ සේප්පු වල හෝ ගිණුම් වල බිලියන ගණනින් මුදල් නැති බව කීම විහිලුවකි. කෙසේ වුවද කන්න අවශ්‍ය කල කබරගොයාත් තලගොයා කරගන්නා ක් මෙන් කටයුතු කරන රජයේ ජනාධිපති රාජපක්ෂ මැතිතුමාගේ එක් ප්‍රකාශයක් නිසා ආරක්ෂක අංශ නිලධරයන් කිසිවිටෙකත් බිය විය යුතු නැත . එනම් -කිසිම නිලධාරියකු යුද අදිකරණයට ගෙන යන්නට මා ඉඩ තබන්නේ නෑ.. එහෙම වුනොත් ඒ ඕනෑම කෙනෙක් වෙනුවෙන් පෝරකයට යාමට මා සූදානම්.."

නැවත හමුවෙමු

දේශප්‍රේම විසිනි

# ගිම්හානයට නැවුම් සිසිලසක් ගෙනෙන




### මාර්තු 27 වන දා
### බෙසන් සෙන්ටර් රඟහලේදී

රත් වී දැවෙන ගිම්හානය ගෙවී වනවාත් සමගම මහපොළොවට සිසිලසක් ගෙනෙන දිය දහරක් මෙන් ගිම්හාන රංගන ප්‍රසංගය සෑම දෙවසරකට වරක්ම වේදිකා ගතවෙයි. මෙවරත් 2010 මාර්තු මස 27 වන සෙනසුරාදා මෙම ප්‍රසංගය බෙසන් සෙන්ටර් රංග ශාලාවේදී දොරට වඩින්නේ අට වන වතාවටයි. මෙයට දශක එක හමාරකට පමණ පෙර නනවඩින් රංග ශාලාවෙන් ගමන් ඇරඹූ මෙම ප්‍රසංගය මෙල්බන් ප්‍රේක්ෂකයන් කවදත් ඉතා ආශාවෙන් වැළඳ ගත් නිසාවෙන්ම මෙය තව තවත් ඉදිරියට ගමන් කරන බව නම් නියත වශයෙන්ම කිව හැකි ය.

මෙම ප්‍රසංගයට ආවේනික වූ කරුණු කීපයක් හේතු කොට මෙල්බන් ප්‍රේක්ෂක ජනතාව ඇද ගැනීමේ එසේත් නැත්නම් ග්‍රහණය කර ගැනීමේ හැකියාවක් එය සතු යයි මම සිතමි. එනම් වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම විවිධ ප්‍රසංගයක් වන මෙහි ගායන වාදන නර්තන හා රංගන යන සියලු අංශ ඇතුළත් වී තිබීම තුළින් ප්‍රේක්ශකයා ඒකාකාරී බවෙන් මුදවා සැමගේ රුචි අරුදියට සාධාරණයක් ඉටු වන අයුරින් අංග එක් කොට තිබීමයි.

ඉතා හොඳ පෙර සූදානමකින් ගෙන එන ගිම්හාන රංගන ප්‍රසංගය ඉදිරිපත් කිරීම නිර්මාණශීලී නව මුහුණුවරකින් කිරීම තුළින් ප්‍රේක්ෂකයා තුළ අලුත් දෙයක් දැක බලා ගැනීමට ආශාවක් ඇති කර ඇත. මෙම ප්‍රසංගය මෙල්බන් ප්‍රෙක්ෂක ජනතාව වෙත ගෙන එනු ලබන්නේ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ආදි ශිෂ්‍ය සංගමය මගිනි.

කෙසේ වුවද මා මෙතෙක් දුටු ගිම්හාන රංගන ප්‍රසංග වල දක්නට ලැබුණු දෙයට වඩා අලුත් දෙයක් දැක බලා ගැනීමේ අටියෙන් සංගමයේ උප ලේකම් රෝහණ අමරතුංග මහතා සමගින් මම මෙම රංගනය පුහුණු වීම් කරන ශාලාව වෙත පිය නැගුවෙමි. ශිල්ප ශිල්පීන් 150කට වැඩි පිරිසක් සහභාගි වන මෙම දැවැන්ත ප්‍රසංගයේ බොහොමයක් අංග පුහුණු වන අයුරු දැක බලා ගත් එම හෝරා කීපය තුළ මා ලබා ගත් ආශ්වාදය වචන වලට පෙරළිය නොහැකි තරම්ය. මා කලිනුත් සඳහන් කළ පරිදි අලුත් ආකාරයේ අත්දැකීම් මවන මෙම ප්‍රසංගය ඔබ නැරඹිය යුතු ප්‍රසංගයක් බව පමණක් සඳහන් කරනු කැමැත්තෙමි.

ප්‍රසංගය පුහුණු වීම් කරන අවස්ථාවේ සංගමයේ සභාපති සනී අපොන්සු මහතා පැවසුවේ - ප්‍රධාන වශයෙන් ප්‍රසංග දෙකක් මෙල්බන් පුර වේදිකාවට ගෙන එනවා. ඒ යෞවන රංගන ප්‍රසංගය හා ගිම්හාන රංගන යන ප්‍රසංග දෙකයි. යෞවන රංගන ප්‍රසංගය මෙල්බන් යෞවන යෞවනියන්ට වේදිකාව මත ඔවුන්ගේ හැකියාවන් වැඩි දියුනු කර ගැනීමට අවස්තාව සළසා දෙන අටියෙන් සංවිධානය කරන ප්‍රසංගයක්. එහිදී අපි ඔවුන්ට ඔවුන්ගේ අඩු පාඩු තුලින්ම ඒවා නිවැරදි කරගෙන ඉදිරියට යාමට නිදහස ලබා දී තිබෙනවා. ගිම්හාන රංගන ප්‍රසංගය මෙයට තරමක් වෙනස්. මෙහිදී අපි ඉතා වගකීමකින් ඉහළම දේ ප්‍රේක්ශකයින්ට ලබා දීමට කටයුතු කරනවා. මේ සඳහා ඉතාම කැපවීමකින් කටයුතු කරන අප නිලධාරි මණ්ඩලය ඇතුළු සියලු දෙනාම මම ස්තුති